**ශීර්ෂය 189 මහජන ආරක්ෂක අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 189 මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 08 වැනි දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2023 දෙසැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 මාර්තු 25 දිනැති අංක 01/04/16/JLO/2023 දරන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)ගේ ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශයට අයත් වාහන 04 ක් අවස්ථා 05කදී අනතුරට ලක් වී ඇති අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම I හා ඇමුණුම II තුළ ඉදිරිපත්කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා අතර, අතපසුවීමකින් මෙම වාහන අනතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීම මඟහැරී තිබුණු බව දක්වා තිබුණි. | යොමුගත මාර්ගෝපදේශය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනයන්හී ඇමුණුම I හා II තුළ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතු ය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි හා ඉදිකිරීම් කෙරීගෙන යන වැඩ ශේෂය රු.677,991,054 ක් වුව ද, 2023 ජනවාරි 01 දිනට එය රු.732,237,046 ක් ලෙස දැක්වීම හේතුවෙන් SA – 82 හි ආරම්භක ශේෂය රු.54,245,992 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022.12.31 දිනට පැවති කෙරීගෙන යන වැඩ අතරින් ප්‍රවර්ථන වර්ෂයේදී සිදුකර ඇති රු.52,410,795ක වටිනාකම භාණ්ඩාගාර සාරාංශයේ තාක්ෂණික දෝෂයක් මත ආරම්භක ශේෂයට එකතු වී ඇත. රු.1,835,195ක් වූ අංක 3810 දරන වවුචරය වත්කමක් ලෙස වාර්තා කිරීමේදී තාක්ෂණික දෝෂයක් මත දෙවරක් සටහන් වී ආරම්භක ශේෂයට එකතු වී ඇත. මේ හේතුවෙන් වර්ෂයේ අවසාන ශේෂය රු. 1,835,195 ක් වැඩියෙන් සටහන් වී ඇති අතර, එය නිවැරදි කිරීම සඳහා | සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන මඟින් කරන ලද ඉදිකිරීම් ආරම්භක ශේෂයට ගැළපිය නොහැක. |

| | | | |
|---|---|---|---|
| | | 2024 වර්ෂයේ ජ'නල සටහන් යෙදීමට කටයුතු කර ඇති බව දක්වා තිබුණි. | |
| **(ii)** | 2022 දෙසැම්බර් 31 දිනට අනෙකුත් යන්ත්‍ර සහ උපකරණ ශේෂය රු.2,724,696,879 ක් වුව ද, 2023 ජනවාරි 01 දිනට එය රු.2,831,925,861 ක් ලෙස දැක්වීම හේතුවෙන් SA – 82 හි ආරම්භක ශේෂය රු.107,228,982 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම සිගාස් මෘදුකාංගය තුළ ඇති තාක්ෂණික ගැටළුව 2022 අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී ද මෙලෙස ම පැවති අතර, එය භාණ්ඩාගාරයට ලිඛිතව මෙන්ම වාචිකව ද දැනුම්දී ඇති නමුත්, මෙතෙක් නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා නොදීම හේතුවෙන් මෙම වෙනස්කම් නිරූපනය වන බව දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වලින් ලබාගත් වත්කම් අගය ආරම්භක ශේෂයට ගැළපිය නොහැක. |
| **(iii)** | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය (ACA-6) අනුව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්හි මුළු වටිනාකම රු.8,646,567,158 ක් වුව ද, එදිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.8,923,747,158 ලෙස දක්වා තිබීම හේතුවෙන්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් රු.277,180,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ACA-6 හි දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් වටිනාකම වන රු.8,646,567,158 නිවැරදි මූල්‍ය නොවන වත්කම් වටිනාකම වන අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ශේෂය ගෙන යාමේදී මුද්‍රණ දෝෂයක් සිදු වී ඇති බව දන්වා සිටින අතර, 2024 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙය සැලකිල්ලට ගන්නා බව දක්වා තිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ශේෂය ගෙනයාමේදී නිවැරදි අගය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය. |
| **(iv)** | වැය ලෙජර අනුව සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් අත්පත් කරගැනීම සඳහා රු.237,371,259 ක් වැයකර තිබුණ ද, මූල්‍ය වත්කම් ප්‍රකාශයෙහි (ACA-6) මිලදී ගැනීම් ලෙස රු.77,731,482ක් දක්වා තිබීම හේතුවෙන්, වර්ෂය තුළදී මිලදී ගැනීම් රු.159,639,777 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂය වෙනුවෙන් වත්කම් අත්පත් කරගැනීම් සියල්ල නව සිගාස් මෘදුකාංගය වෙත උඩුගත (Upload) කර ඇති අතර, මෙම සිගාස් මෘදුකාංගය තුළ ඇති තාක්ෂණික ගැටලුව 2022 අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී ද මෙලෙස ම පැවති අතර, එය භාණ්ඩාගාරයට ලිඛිතව මෙන්ම වාචිකව ද දැනුම්දී ඇති නමුත් මෙතෙක් නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා නොදීම හේතුවෙන් මෙම වෙනස්කම් නිරූපනය වන බව දක්වා තිබුණි. | තාක්ෂණික ගැටළු කඩිනමින් නිරාකරණය කර නිවැරදිව අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු ය. |

(ආ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛනය පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **බැරකම් පිළිබඳ ලේඛණය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | සියලුම බැරකම් සිගාස් ගිණුම්කරණ යෙදවුම වෙත ඇතුළත් කරනු ලබන අතර, එමගින් මුදල් තිබෙන බවටත් නිසි පරිදි බිල්පත් ලැබෙන බවටත්, එම බිල්පත් අප්‍රමාදව ගෙවීම් කරන බවටත් ගණකාධිකාරී විසින් නිරන්තර පරීක්ෂා කරනු ලබයි. එසේ වුව ද ඉදිරියේදී බැරකම් ලේඛනයක් තබාගැනීමට කටයුතු කරනු ලබන බව දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛණයක එම බැරකම් සටහන් කළ යුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මහජන ආරක්ෂක අමාත්‍යාංශය සඳහා අයවැයගත මුළු පුනරාවර්ථන වියදම රු.12,222,000,000 ක් වුව ද, වැඩසටහන් අනුව වියදම් සාරාංශයෙහි (ACA-2) පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තුගත අයවැය ප්‍රතිපාදනය රු12,221,000,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | විශේෂ කාර්ය බලකාය (ව්‍යාපෘති 03) වෙත 189-01-03-0-1508 වෙනත් මාරු කිරීම් යටතේ රු.1,000,000 ක ප්‍රතිපාදනයක් ලබාදී ඇති අතර, එය ACA-2(ii) යටතේ නිවැරදිව දක්වා ඇතත්, ACA-2 වෙත ප්‍රතිපාදන සාරාංශ කිරීමේදී මෙම ප්‍රතිපාදන ප්‍රමාණය MS excel මඟින් යොමුගත කිරීමේදී මගහැරීම නිසා ACA-2 දක්වා ඇති ශුද්ධ ප්‍රතිපාදනය ද රු.1,000,000 කින් වෙනසක් නිරූපනය වන බව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී නිවැරදි අගයන් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA-10) අනුව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.13,743,734,872 ක් වුව ද, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශයෙහි (ACA-2) මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.13,742,734,872 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | විශේෂ කාර්ය බලකාය (ව්‍යාපෘති 03) වෙත 189-01-03-0-1508 වෙනත් මාරු කිරීම් යටතේ රු.1,000,000 ක ප්‍රතිපාදනයක් ලබාදී ඇති අතර, එය ACA-2(ii) යටතේ නිවැරදිව දක්වා ඇතත්, ACA-2 වෙත ප්‍රතිපාදන සාරාංශ කිරීමේදී මෙම ප්‍රතිපාදන ප්‍රමාණය MS excel මඟින් යොමුගත කිරීමේදී මගහැරීම නිසා ACA-2 දක්වා ඇති ශුද්ධ ප්‍රතිපාදනය ද රු.1,000,000 කින් වෙනසක් නිරූපනය වන බව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී නිවැරදි අයගන් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා ප්‍රතිපාදිත රු.2,000,000 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු.500,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | 189-1-1-0-1203 අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් පත් නොවූ බැවින්, නිල ඇඳුම් දීමනාව ලබානොදීම නිසාද, 189-1-1-0-1506 අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා රජයේ නිලධාරීන්ට ලබාදෙන දේපල ණය ලබාගත් රාජ්‍ය නිලධාරීන් පත් නොවීම නිසා ද, 189-1-3-0-1508 විශේෂ කාර්ය බලකා නිලධාරීන්හට වන්දි ගෙවීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසාද, 189-1-1-0-2002 විධිමත් නඩත්තු කිරීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සඳහා ප්‍රාග්ධන ස්වරූපයේ අලුත්වැඩියා ඇති නොවූ බැවින් ද ඉතිරිවීම් පෙන්නුම් කරනු ලබන අතර, 2024 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී මේවා සැලකිල්ලට ගෙන ඇත. | උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු ය. |
| (ඈ) | වැය විෂයයන් 18 ක් සඳහා සලසා තිබූ එකතුව රු.1,504,550,000 ක් වූ ප්‍රතිපාදිතයෙන් රු.770,880,831 ක් ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය සියයට 35 සිට සියයට 90 දක්වා පරාසයක් ගෙන තිබුණි. | 2023 වර්ෂය සඳහා වෙන් කරන ලද පුනරාවර්තන ප්‍රතිපාදන සියයට 6 කින් කපා හැරීම හා ජාතික අයවැය චක්‍රලේඛ මගින් වියදම් කළමනාකරණය කිරීම සඳහා උපදෙස් ලබාදී ඇති බැවින්, අත්‍යාවශ්‍ය වියදම් කිරීම නිසාවෙන් හා වි.කා.බ යට උණ්ඩ ලබාගැනීම සඳහා විවෘත කළ ණයවර ලිපියෙහි සැපයුම් කාලය දීර්ඝ වීම, සාමසාධක පොලිස් බලමුළු සඳහා උණ්ඩ මිලදී ගැනීමට කරන ලද ඇණවුම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුමැතිය නොලැබීම හා උණ්ඩවල ආයු කාලය වසර 5 ක් වීම නිසා තාවකාලිකව අත්හිටුවීම හා ජීප් රථ දෙකක් මිලදී ගැනීම නතර කිරීම හේතුවෙන් රු. මිලියන 291 ක් ප්‍රතිපාදන ඉතිරි වීම හා විශේෂ කාර්ය බලකාය සඳහා 2023.12.31 දිනට පැවති බිල්පත් නිරවුල් කිරීමට ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම මත රු.මිලියන 321 ක බැරකම් පැවතීම මෙම ඉතිරිවීම්වලට හේතු වූ බව දක්වා තිබුණි. | උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු ය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 13 ක් සඳහා මු.රෙ. 66/69 යටතේ රු.326,400,000ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණු අතර, එම මාරුකිරීම් ඇස්තමේන්තුගත වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස | පුද්ගල අනන්‍යතා පිළිබඳ වූ මහ ලේකම් කාර්යාලය (සුහුරුපාය ගොඩනැගිල්ල) මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතට පැවරීමත් සමඟ අමාත්‍යාංශය 17 හා 18 මහල් වෙත ගෙන යාම හේතුවෙන් අත්‍යාවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සඳහා ද, අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී ද මු.රෙ.66 මගින් අවශ්‍ය | වාර්ෂික ඇස්තමේන්තු නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | සියයට 26 සිට සියයට 4920 ක පරාසයක් ගෙන තිබුණි. | ප්‍රතිපාදන සලසාගෙන ඇති බව දක්වා තිබුණි. | |
| (ඊ) | විශේෂ කාර්ය බලකායේ වැය විෂයය අංක 189-1-3-0-1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු වියදම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.50,000,000ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණ ද, ඉන් රු.5,000,000ක් හෙවත් සියයට 10 ක් මු.රෙ. 66/69 යටතේ අමාත්‍ය කාර්යාලයේ වැය විෂයය අංක 189-1-1-0-1301 වාහන නඩත්තු වියදම් වෙත මාරු කර තිබුණි. | ගරු අමාත්‍යතුමා හා කාර්ය මණ්ඩලය වෙත වෙන් කර ඇති සියලුම වාහන අවුරුදු 10 ඉක්ම වූ ඒවා වන බැවින්, නඩත්තු වියදම් හා අත්‍යාවශ්‍ය අලුත්වැඩියා වියදම් ඉහළ යාම, වාර සේවාවන් ඉහළ යාම හේතුවෙන්, 2023 වර්ෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර, මු.රෙ. 66 මඟින් රු.5,000,000 ක අමතර ප්‍රතිපාදන මාරු කර ගන්නා ලද බව දක්වා තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉදිරි අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. |
| (උ) | විශේෂ කාර්ය බලකායේ වැය විෂයය අංක 189-1-3-0-1203 යටතේ ආහාරපාන හා නිල ඇඳුම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.270,000,000ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණ ද, ඉන් රු.13,000,000ක් අමාත්‍යාංශ පරිපාලන සහ ආයතනික සේවා ව්‍යාපෘතිය සඳහා ද, රු.57,800,000ක් විශේෂ කාර්ය බලකා ව්‍යාපෘතියේම වෙනත් වැය විෂයයන් 04 ක් සඳහා ද මු.රෙ. 66/69 යටතේ මාරු කර තිබූ අතර, එලෙස මාරු කළ වටිනාකම වූ රු.70,800,000ක මුදල, විශේෂ කාර්ය බලකායේ ආහාර හා නිල ඇඳුම් සඳහා සමාලෝචිත වර්ෂයට ප්‍රතිපාදිත මුදලින් සියයට 26 ක් විය. | 2102- මහජන ආරක්ෂක අමාත්‍යාංශය සුහුරුපාය ගොඩනැගිල්ලෙහි 17 සහ 18 මහල්වල ස්ථාපිත කිරීමේ කටයුතු සඳහා රු.13,000,000 ක් ද, 1301- ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදී ඇති වාහන සඳහා වන නඩත්තු ගෙවීම් සඳහා ද අමතර ප්‍රතිපාදන ප්‍රමාණය 1403- භාණ්ඩාගාරය විසින් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය ලබා නොදීම හා ජල හා විදුලි බිල ඉහළ යාම නිසා ද, 2102 - ඇස්තමේන්තුගත නොවූ නව ප්‍රසම්පාදනයක් ලෙස ජයවර්ධනපුර කඳවුර නවීකරණ කටයුතු සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ මිලදී ගැනීම සඳහා ද, 2104 - වි.කා.බ.යේ කලපළුවාව හා වතුකොලකන්ද යන නව ඉදිකිරීම් ව්‍යාපෘතියේ බිල්පත් නිරවුල් කිරීම සඳහා ද මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන සලසාගැනීමට කටයුතු කළ බව දක්වා තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉදිරි අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. |
| (ඌ) | විශේෂ කාර්ය බලකායේ වැය විෂයය අංක 189-1-3-0-1205 යටතේ වෙනත් සඳහා සමාලෝචිත වර්ෂය | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත 1302- යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා ද 1402- තැපැල් හා සන්නිවේදන වියදම ඉහළ යාම නිසා ද, 1403- ජල හා විදුලි බිල ඉහළ යාම | වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඉදිරි අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිලිමත් විය යුතු |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් රු.550,000,000ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණ ද, එම ව්‍යාපෘතියේම වැය විෂයයන් 10 ක් සඳහා රු.244,575,000 ක් හෙවත් සියයට 44 ක් මු.රෙ. 66/69 මඟින් මාරු කර තිබුණි. | නිසා ද, 1404- කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සඳහා කුලී ගෙවීම් සඳහා ද, 1204 - වෛද්‍ය සැපයුම් සඳහා ද, 1302- යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා ද, 1401 - කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සඳහා මෙම වැය ඇස්තමේන්තුගත නොවූ නව ප්‍රසම්පාදනයක් ලෙස ජයවර්ධනපුර කඳවුර නවීකරණ කටයුතු සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට සිදුවීම, 2103- වි.කා.බ.ය විසින් භාවිතා කරනු ලබන සන්නිවේදන පද්ධතිය වඩාත් කාර්යක්ෂම කරගැනීම සඳහා සැපයුම්කාර ආයතනය වෙත මුදල් ගෙවීමට අවශ්‍ය වීම, 1102- රාජ්‍ය තාන්ත්‍රික ආරක්ෂක රාජකාරී අත්‍යාවශ්‍ය පුහුණුවීම් හා උපදේශක කටයුතු සඳහා වන විදේශ සංචාරයන්හි නිරතවීම්වලට ගෙවීම් කිරීම මත අමතර ප්‍රතිපාදන මු.රෙ 66 යටතේ සලසා ගැනීමට කටයුතු කළ බව දක්වා තිබුණි. | ය. |
| (එ) | විශේෂ කාර්ය බලකා ව්‍යාපෘතියේ වැය විෂයය අංක 189-1-3-0-1409 (වෙනත්) සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.20,000,000ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණ ද, ඉන් රු.4,000,000ක් හෙවත් සියයට 20 ක් එම ව්‍යාපෘතියේ ම වැය විෂයය අංක 189-1-3-0-1102 (විදේශීය ගමන් වියදම්) වෙත මු.රෙ. 66/69 මඟින් මාරු කර තිබුණි. | රාජ්‍ය තාන්ත්‍රික ආරක්ෂක රාජකාරී අත්‍යාවශ්‍ය පුහුණුවීම් හා උපදේශක කටයුතු සඳහා වන විදේශ සංචාරයන්හි නිරතවීම්වලට ගෙවීම් කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත අමතර ප්‍රතිපාදන මු.රෙ 66 යටතේ සලසා ගැනීමට කටයුතු කළ බව දක්වා තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉදිරි අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. |
| (ඒ) | අමාත්‍යාංශයේ වැය විෂයය 07 ක් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනයේ එකතුව රු.195,750,000ක් වූ අතර, වර්ෂය තුළ මු.රෙ. 66 හා පරිපූරක මඟින් රු.486,209,000ක් දක්වා වැඩි කරගෙන තිබුණි. එලෙස මු.රෙ. 66 හා පරිපූරක මඟින් ලබාගත් ප්‍රතිපාදනය රු.290,459,000ක් වූ අතර, එය මූලික වියදම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් | පුද්ගල අනන්‍යතා පිළිබඳ වූ මහ ලේකම් කාර්යාලය (සුහුරුපාය ගොඩනැගිල්ල) මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතට පැවරීමත් සමඟ අමාත්‍යාංශය 17 හා 18 මහල් වෙත ගෙන යාම හේතුවෙන් අත්‍යාවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සඳහා ද, වාර්ෂික විසර්ජන පනත මගින් ප්‍රතිපාදන මාරු කරගැනීම සඳහා බලය ලබාදී ඇති බැවින් ද, අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී මු.රෙ.66 මගින් අවශ්‍ය ප්‍රතිපාදන සලසාගෙන ඇති බව දක්වා තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉදිරි අවශ්‍යතාවයන් පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. |

| | | |
|---|---|---|
| ලෙස සියයට 104 සිට සියයට 4920 ක පරාසයක පැවති බැවින් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි අධ්‍යයනයකින් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | | |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 3.3 ඡේදය හා මු.රෙ. 94 ප්‍රකාරව එළඹෙන ලද බැරකම් හා බැඳීම් වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත්, වැය විෂයයන් 31 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට එළඹී තිබුණු බැඳීම් සහ බැරකම් රු.11,977,207ක් බැරකම් හා බැඳීම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | මු.රෙ.94 (2) ප්‍රකාරව පුනරාවර්ථන වියදම් සඳහා ඊළඟ මුදල් වර්ෂය තුළ බේරුම් කිරීමට අපේක්ෂාවෙන් බැරකමකට බැඳිය හැකි අතර, පවත්නා මුදල් වර්ෂයේ ඇස්තමේන්තු තුළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත සිගාස් යෙදුමේ බැරකම් ප්‍රකාශනයට ඇතුළත් කර නොමැති බව දක්වා තිබුණි. | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය සහ මු.රෙ. 94 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවටත්, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳ කලින් කලට සමාලෝචනයක් සිදු කරන බවටත්, ඒ අනුව පාලන පද්ධතියේ වෙනස්කම් සිදු කරනු ලබන බවටත් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-පී මගින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික වී විගණනයට ඉදිරිපත් කර ඇති බව දක්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහකර දැක්වේ.

**නිරීක්ෂණය**

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **වත්කම් කළමනාකරණ චක්‍රලේඛ** 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන චක්‍රලේඛයේ 07 ඡේදය | සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගන්නා ලද හා අපහරණය කරන ලද වාහන හැර අනෙකුත් වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර නොතිබුණි. | කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් NFAMS පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ලබාදුන් උපදෙස් අනුව 2023 වර්ෂයේදී වාහනවල තොරතුරු පමණක් NFAMS පද්ධතියට ඇතුළත් කිරීමට උපදෙස් දෙන ලදී. එබැවින් අනෙකුත් වත්කම්වලට අදාළ මිලදී ගැනීම් නව අපහරණය කිරීම් වාර්තා නොකරන ලදී. 2023 වර්ෂයේ මාර්ගගත ක්‍රමයට NFAMS පද්ධතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ හෙයින් වි.කා.බ. වාහන හැර අනෙකුත් වත්කම්වලට අදාළ තොරතුරු 01/2017 චක්‍රලේඛය ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුවට වාර්තා ලෙස යොමු කිරීම සිදු නොකළ බව දක්වා තිබුණි. | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව කටයුතු කළ යුතු ය. |

## 2.5 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය**<br>සුහුරුපාය ගොඩනැගිල්ලේ 10 වන මහලේ එක් බිම් කොටසක පමණක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පවත්වාගෙන ගිය ද 10 වන මහල සඳහා සහ 8 වන මහලේ බිම් කොටසක් සඳහා ව්‍යාපෘති මුදල්වලින් ජල හා විදුලි බිල්පත් ගෙවා තිබුණි. ඒ අනුව 2023 වර්ෂය සඳහා ව්‍යාපෘති කාර්යාලයට අයත් නොවන බිම් කොටස් දෙකක් සඳහා රු.16,662,198ක විදුලි ගාස්තුවක් සහ රු.1,030,913ක ජල ගාස්තුවක් ගෙවා තිබුණි. තව ද විදුලි ගාස්තු වෙනුවෙන් හිඟ පොළී ලෙස රු.107,811ක මුදලක්ද ව්‍යාපෘති ඒකකය විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය විසින් මහජනයාගේ දත්ත රැස්කිරීම ආරම්භකර එම දත්ත සුරක්ෂිතව ආරක්ෂා කිරීම සඳහා පරිගණක සර්වර් පද්ධතිය සවිකර පරිගණක දත්ත මධ්‍යස්ථානය සුහුරුපාය ගොඩනැල්ලේ 08 වන මහලේ ස්ථාපිත කර ඇති බැවින් ද, 10 වන මහලේ B පර්යන්තයේ ව්‍යාපෘති කාර්යාලය ද C පර්යන්තයේ කොටසක ව්‍යාපෘතියට අයත් ශ්‍රවණාගාරය ද පවත්වාගෙන යන බැවින්ද, ආරම්භක අවස්ථාවේදී 10 වන මහල සම්පූර්ණව යොදා ගැනීමට සැලැසුම්කර තිබූ බැවින් ද, විදුලි හා ජලබිල් ගෙවා ඇති අතර, ඉදිරියේදී පු.ලි.දෙ. කොමසාරිස් ජනරාල් සමඟ සාකච්ඡාකර මෙම වියදම තවදුරටත් විධිමත් කරගැනීමට කටයුතු කරයි.<br>නියි දිනට අක්මුදල් නොලැබීම හේතුවෙන් විදුලි බිල්පත් සඳහා හිඟ පොළී මුදලක් ගෙවීමට සිදු වී ඇති අතර, ඉදිරියේදී නියමිත දිනයන්වලදී අක්මුදල් ලබාගැනීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත්කර ඇති බව දක්වා තිබුණි. | ජල හා විදුලි බිල්පත් ගෙවීමේ දී විද්‍යුත් හැඳුනුම්පත් ව්‍යාපෘතියට අයත් බිම් ප්‍රමාණයට සහ අදාළ බිල්පත් නියමිත දිනට ගෙවීමට කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී (Formed Police Unit) සඳහා විශේෂ කාර්ය බලකා නිලධාරීන් යෙදවීමට අදාළ ව්‍යාපෘතිය.**<br>අංක අමප/16/0738/703/083 දරන 2016 මැයි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත් ජාතීන්ගේ | මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කරන ලද අතර, එදින සිට මේ දක්වා මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද රුපියල් මිලියන 2765 ක ප්‍රතිපාදන මගින් මිලියන 1936 ක් වැයකර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මාර්ගෝපදේශ ලේඛන අනුව එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී යෙදවීමට අවශ්‍ය වාහන සහ අනිකුත් උපාංග මිලදී ගැනීම සිදුකර ඇත.<br>2022.09.07 සිට 2022.09.10 දින දක්වා සිදුකරන ලද අවසන් පරීක්ෂණයෙන් පසුව | අපේක්ෂිත අරමුණු අප්‍රමාදව ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

සාමසාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බලඇණියක් මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ, ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගැනීමට රුපියල් මිලියන 1590 ක මුදලක් ද ලබාදී තිබුණි. එම මුදල් ප්‍රමාණවත් නොවීම මත 2017 අගෝස්තු 30 වන දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/17/1811/784/001-1 යටතේ තවත් රුපියල් මිලියන 1175 ක මුදලක් සඳහා ද අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.1872,800,823ක වියදමක් දරා තිබුණත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම මත මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය වැඩි කරගැනීම, මෙම ඒකකයේ රාජකාරී නියුක්ත නිලධාරීන්ට අමතර ආදායමක් ලැබීම ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකාය වෙත ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලබාගැනීම, සහභාගී වන නිලධාරීන්ගේ නිපුනතා වර්ධනය හා ජාත්‍යන්තර වශයෙන් අත්දැකීම් ලබාගැනීම, විශේෂ කාර්ය බලකායේ සුදුසුකම් සහිත නිලධාරීන් හට අවස්ථා ලබාදීම තුළින් අභිප්‍රේරණය කිරීම යන අරමුණු ඉටුවී නොතිබුණි.

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා 2022.10.27 දින විශේෂ කාර්ය බලකාය සාම සාධක පොලිස් බලමුළුව UN Peacekeeping Capability Readiness System (PCRS) හි Level 3 මට්ටමේ ස්ථාපිත කිරීමට නිර්දේශ කර තිබුණි.

මෙම මට්ටම් වෙත උසස් කිරීම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පොලිස් කොට්ඨාශය හා අදාළ සෙසු කොට්ඨාශ අතර සිදුවන ක්‍රියාවලියක් වන බැවින්, දීර්ඝ කාලයක් ගතවීම ද අදාළ මට්ටම් වෙත උසස් කිරීම හා ඊට අදාළව පරීක්ෂණයන් සිදුකරන කාලවකවානු තීරණය කිරීම ද එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින්ම සිදුකරනු ලබයි.

විශේෂ කාර්ය බලකාය සාම සාධක පොලිස් බලමුළුව UN Peacekeeping Capability Readiness System (PCRS) හි Level 3 මට්ටමට උසස්කර ඇති බව 2024.04.29 දින එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පොලිස් කොට්ඨාශය විසින් ලිඛිතව දැනුම්දීම සඳහා වසරකට අධික කාලයක් ගතවී ඇති අතර, එසේ කාලය ගතවීම විශේෂ කාර්ය බලකායේ පාලනයෙන් තොර කරුණක් බව දක්වා තිබුණි.

මෙම දැනුම්දීම පරිදි මීලඟ මට්ටම වන Rapid Deployemet Level (RDL) වෙත උසස් කිරීමට සිදුකළ යුතුව ඇති Assessment of Operational Capability (AOC) හා Verification Visit (VV) සිදුකිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය දැනුවත් කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

තව ද එම පරීක්ෂණවලින් අනතුරුව (PCRS) හි අවසන් මට්ටම වන Rapid Deployemet Level (RDL) මට්ටම වෙත උසස් කිරීම සිදුකිරීමට නියමිතව ඇති අතර එම Rapid Deployemet Level (RDL) මට්ටමට උසස් කළ දින සිට රාජකාරී පිටව යනතෙක් අදාළ මට්ටමේ රැඳී සිටින කාලය සඳහා මිලදීගෙන ඇති ප්‍රධාන උපකරණවල නඩත්තු මුදලින් සියයට 25 මුදලක් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් විශේෂ කාර්ය බලකාය සාම සාධක පොලිස් බළමුළුව වෙත ගෙවීම් කිරීම ද සිදුකරන බව ද සාම සාධක රාජකාරී සඳහා වූ මාර්ගෝපදේශන ලේඛනයන්හි සඳහන් කර ඇත.

ඒ අනුව විශේෂ කාර්ය බලකාය සාම සාධක බළමුළුව එක්සත් ජාතීන්ගේ සාම සාධක

| | | |
|---|---|---|
| ලබාගෙන යාම සඳහා මිලදී ගත් වාහන 57 ක් ටේලර් 03 ක් සහ අනෙකුත් භාණ්ඩ හා උපකරණ ලබාගැනීම සඳහා රුපියල් මිලියන 1873 ක් පමණ වැයකර තිබුණි. සාමසාධක රාජකාරී සඳහා පිටව යාම ප්‍රමාදවීම මත මිලදී ගන්නා ලද වාහන ඇතුලු අනෙකුත් භාණ්ඩ හා උපකරණ වර්ෂ 01 සිට වර්ෂ 06 අතර කාලයක් නඩත්තු කරමින් නිශ්කාර්යව පැවතීම සහ එම භාණ්ඩවලට ලබාදී ඇති වගකීම් කාලය ද උපයෝජනයකින් තොරව ඉකුත් වීම, උපකරණ නිෂ්ක්‍රීයව පැවතීමෙන් සිදුවන හානි පිළිබඳ අවධානම මෙන්ම සමහර භාණ්ඩ කල් ඉකුත්වී පැවතීම ද විගණනයට නිරීක්ෂණය විය. | රාජකාරී පිටත් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු තවදුරටත් සිදුකරමින් පවතින බවත් මෙම ව්‍යාපෘතියේ කටයුතු අක්‍රීයව නොමැති බව දක්වා තිබුණි. | |

### 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකම කාණ්ඩයට අයත් භාණ්ඩ එකවර මිල කැඳවීම්කර ලබාගැනීමට හැකියාව තිබියදී අවස්ථා 20 කදී මිල කැඳවීම්කර එකම ආයතනයකින් රු.3,321,832ක් වැයකර භාණ්ඩ මිලදීගෙන තිබූ අතර, කඳවුරු සඳහා අවශ්‍ය ගෑස් ලිප් 18 ක් අවස්ථා 10 කදී මිල කැඳවීම්කර එකම ආයතනයකින් මිලදීගෙන රු.618,000ක මුදලක් ගෙවා තිබුණි. මේ අනුව එකවර මිල කැඳවීම්කර භාණ්ඩ ලබාගැනීමට හැකියාව තිබියදී අවස්ථා කිහිපයකදී | 2022/8/18 වන දිනට පෙර උතුරු නැගෙනහිර ප්‍රදේශවල ස්ථාපිත කඳවුරු සඳහා පමණක් ආහාර පිසීම සඳහා ගෑස් භාවිතා කළද පසුව සෙසු කඳවුරු සඳහා ද ආහාර පිසීම වෙනුවෙන් ගෑස් භාවිතා කිරීමට අනුමැතිය ලබාදෙන ලදී.<br><br>ඒ අනුව වර්ෂ අවසාන කාලපරිච්ඡේදය තුළදී අදාළ මිලදී ගැනීම් අවසන් කළ යුතු බැවින්, කඳවුරු මට්ටමින් ඉදිරිපත් වන ඉල්ලීම් අනුව මිලදී ගැනීම් ආරම්භ කිරීම නිසා වෙන වෙනම ප්‍රසම්පාදනයන් ලෙස මිල ගණන් කැඳවීම සිදුකර ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී එකම කාණ්ඩයේ භාණ්ඩ එක් ප්‍රසම්පාදනයක් ලෙස මිල ගණන් කැඳවා සිදු කරන බව දක්වා තිබුණි. | ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී පිරිවැය අවම වන පරිදි උපරිම කාර්යක්ෂමතාවයකින් කටයුතු කළ යුතු ය. |

මිල කැඳවීම්කර භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

## 3.3 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියමිත කාලයේදී විදුලි බිල්පත්වලට මුදල් නොගෙවීම හේතුවෙන් හිඟ විදුලි බිල්පත්වලට අදාළව අධිභාර වශයෙන් රු.210,901ක මුදලක් ගෙවා තිබුණි. | ITMIS පද්ධතිය මගින් වවුචර්පත් ඉදිරිපත්කර අක්මුදල් ලබාදීමට පෙර සෑම මසකම අවසාන දිනට ඉදිරිපත් කරනු ලබන අතැති බිල්පත් වාර්තාව අනුව අක්මුදල් නිදහස් කරනු ලැබූ අතර, මාසය අවසාන දින වන විට බිල්පත් ඉදිරිපත් නොවුවහොත් අක්මුදල් ලබාගැනීමට නොහැකි වීම මත බිල්පත් නියමිත දිනට පෙර ගෙවීමට නොහැකි වී ඇත. ඉදිරියේදී නියමිත දිනට ප්‍රථම ගෙවීමට හැකි වනු ඇති බව දක්වා තිබුණි. | මාසික විදුලි බිල්පත් නියමිත දිනට ගෙවීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | මහජන ආරක්ෂක අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් සඳහා 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වායු සමීකරණ පද්ධතිය, පින්තාරු වැඩ ඇතුලු අනෙකුත් දෝෂ සඳහා රු.3,381,239ක් ද 2023 වර්ෂයේ ජුනි දක්වා පමණක් Suspension පද්ධති හා අනෙකුත් දෝෂ සඳහා රු.6,401,830 ක් ලෙස එකතුව රු.9,783,069 ක අලුත්වැඩියා වියදමක් දරා තිබුණි. 2023 වර්ෂයේ අමාත්‍ය කාර්යාලයේ 1301 - වාහන නඩත්තු වියදම් වැය විෂයයෙහි ප්‍රතිපාදිත මුදල රු.5,000,000 ක් වූ අතර, වැය විෂයයන් 03 ක් මඟින් රු.7,500,000 ක් ද මෙම වැය විෂයයට මාරු කරගෙන තිබුණි. | WP CAT 7887 රථය ගරු අමාත්‍යතුමාගේ රාජකාරි සඳහා යොදවා ඇති අතර, අත්‍යාවශ්‍ය නඩත්තු වියදම් හා අලුත්වැඩියාවන් සිදුකර ඇති අතර, ආර්ථික අර්බුදය හේතුවෙන් පැනවූ ආනයන සීමා නිසා මෙන්ම ප්‍රමාදවීම් සිදු වීම. ඇමරිකානු ඩොලරයේ මිල ඉහළ යාම මත අමතර කොටස් මිල ද විශාල වශයෙන් ඉහළ යාම නිසා නඩත්තු වියදම් හා අලුත්වැඩියා වියදම් ද ඉහළ ගොස් ඇත. එසේ වුව ද සියලු අලුත්වැඩියා වියදම් සඳහා යාන්ත්‍රික ඉංජිනේරු වාර්තා ලබාගෙන ඇති බවත්, ගරු අමාත්‍යතුමා හා කාර්ය මණ්ඩලය වෙත වෙන් කර ඇති සියලුම වාහන අවුරුදු 10 ඉක්ම වූ ඒවා වන බැවින්, නඩත්තු වියදම් හා අත්‍යාවශ්‍ය අලුත්වැඩියා වියදම් ඉතා ඉහළ වන අතර, දිවයින පුරා ධාවනය කිරීමට සිදුවීම නිසා වාර සේවාවන් ඉහළ යාම ද පවතී. එබැවින් 2023 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර, ඉතිරිවීම් අපේක්ෂා කළ වැය විෂයයන් මඟින් මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු බව දක්වා තිබුණි. | වාහන නඩත්තු කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු ය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමෙහි නිලධාරීන් මිය යෑම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම, සේවය හැරයාම සහ අනෙකුත් හේතූන් මත දැනට අමාත්‍යාංශයේ සේවයේ යෙදී නොමැති නිලධාරීන් හා සේවකයන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂයට වඩා වැඩි හිඟ ණයශේෂ එකතුව රු.646,979 ක් වූ අතර, ඒ අතරින් වර්ෂ 05 ඉක්ම වූ වැඩ තහනමට ලක් වූ සේවකයින් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.118,793 ක හිඟ ණයශේෂයක් පැවතුණි. | අමාත්‍යාංශයේ 2023.12.31 දිනට වර්ෂයකට වඩා වැඩි හිඟ ණයශේෂය රු.216,659 වන අතර, එම නිලධාරියා විශ්‍රාම පූර්ව නිවාඩු ඉල්ලා ඇතත්, අනුමත වී නොමැති අතර, නැවත සේවයට වාර්තාකර ද නැත. ණය අය කරගැනීම සඳහා නිලධාරියා වෙත ලිපි මගින් දැනුවත්කර ඇති අතර, මේ වන තෙක් මුදල් ගෙවා නොමැත. නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දක්වා තිබුණි. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් අනුව කටයුතු කළ යුතු ය. |
| (ආ) | 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනතේ 9 (ඇ) වගන්තිය අනුව සෑම අවුරුද්දකට ම යටත් පිරිසෙයින් එක් වරක්වත් නියමිත ආකාරයට රාජ්‍ය නොවන සංවිධානයේ ගිණුම් විගණනය කිරීමට සැලැස්විය යුතු වුව ද, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව 2022 වර්ෂයේ ක්‍රියාකාරී මට්ටමේ පවතින රාජ්‍ය නොවන සංවිධාන 691 න් විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඉදිරිපත්කර ඇත්තේ සංවිධාන 54 ක් පමණි. | 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනතේ 9(ඇ) වගන්තිය අනුව සෑම අවුරුද්දකටම යටත් පිරිසෙන් එක් වරක්වත් නියමිත ආකාරයට රාජ්‍ය නොවන සංවිධනයේ ගිණුම් විගණනය කිරීමට සැලැස්වීමට රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල යටතේ දක්වා ඇත. 2022 වර්ෂයේ මූල්‍ය වාර්තා ලබා නොදුන් සංවිධානවලින් එම වාර්තා ගෙන්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය වන විට 2022 වර්ෂයට අදාළව විගණනය කරන ලද මූල්‍ය වාර්තා සංවිධාන 70 ක් විසින් ඉදිරිපත් කර තිබුණි.<br>තව ද කාර්තුවකට එක බැගින් සෑම දිස්ත්‍රික්කයකම ප්‍රගති සමාලෝචන රැස්වීම් 04 ක් පැවැත්විය යුතු ය. එය අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී විසින් පවත්වනු ලබන අතර, එම රැස්වීමේදී විගණන වාර්තා මෙන්ම අනෙකුත් | 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනතේ 9(ඇ) වගන්තිය අනුව කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| | වාර්තා එවීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරනු ලබයි. මීට අමතරව අඛණ්ඩව වසර 03 ක් වාර්තා ඉදිරිපත් නොකරන සංවිධාන අක්‍රිය සංවිධාන ලෙස නම් කරන අතර, ඒ අනුව අපගේ වෙබ් අඩවියේ සක්‍රිය සංවිධාන ලැයිස්තුවක් සඳහන්කර ඇති බව දක්වා තිබුණි. | |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **මහජන ආරක්ෂක අමාත්‍යාංශය**<br>අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 13 ක් පුරප්පාඩු පැවැතීම අමාත්‍යාංශ කටයුතු පවත්වාගෙන යෑමට බාධාවක් වී තිබූ අතර, උක්ත පුරප්පාඩු තුළ අතිරේක ලේකම්, අධ්‍යක්ෂ (ශ්‍රී.ල.ඉ.සේ), අධ්‍යක්ෂ (සැලසුම්), සහකාර ලේකම් හා අභ්‍යන්තර විගණන යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු ද අන්තර්ගත විය. | 2023.12.31 දින වන විට පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ මට්ටමේ සියලුම තනතුරු සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇත. | පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු ය. |
| (ආ) **විශේෂ කාර්ය බලකාය**<br>**i. නිල ඇඳුම් කාර්ය මණ්ඩලය**<br>• නියෝජ්‍ය පොලිස්පති, කාන්තා පොලිස් පරීක්ෂක, මහ සැරයන් හා මහ සැරයන් රියදුරු යන තනතුරයන්හි අනුමත සේවක සංඛ්‍යාව වූ 54 ක ප්‍රමාණයම සියයට 100 ක්ම පුරප්පාඩු වී පැවතුණි. | විශේෂ කාර්ය බලකායට අනුමතව ඇති නියෝජ්‍ය පොලිස්පති තනතුරු 02 සඳහා උසස්වීම් ලබාදීමට සුදුසුකම් සපුරා ඇති ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් විශේෂ කාර්ය බලකායට අනුයුක්තව නොමැති බැවින්, සේවයේ අවශ්‍යතාවය මත රාජකාරී ඉටුකිරීම සඳහා ජ්‍යෙෂ්ඨතම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වරුන් දෙදෙනෙකු පත්කර ඇත. | පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු ය. |
| • සහකාර පොලිස් අධිකාරි තනතුරේ අනුමත සංඛ්‍යාව 44 ක් වුව ද, පුරප්පාඩු 21 ක් පැවැති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 48 ක් විය. | කාන්තා පොලිස් පරීක්ෂක, මහ සැරයන් හා මහ සැරයන් රියදුරු තනතුරුවල පවතින පුරප්පාඩු බඳවාගැනීම් හා උසස් කිරීම් පරිපාටිය අනුව ශ්‍රී ලංකා පොලීසියේ හා විශේෂ කාර්ය බලකායේ නිලධරයන්ට උසස්වීම් ලබාදීමට කටයුතු කරන පළමු අවස්ථාවේදීම සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි.විශේෂ කාර්ය බලකායේ සහකාර පොලිස් අධිකාරි | පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවර ගත යුතු ය. |

| | | |
|---|---|---|
| • පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 6999 ක් වුව ද, පුරප්පාඩු 2959 ක් පැවැති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 42 ක් විය. | තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා උසස්වීම් පරීක්ෂණ මණ්ඩලයක් පැවැත්වීමට අනුමැතිය ලබාගැනීමට පොලිස්පතිතුමා වෙත යොමුකළ ඉල්ලීම මහජන ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමුකර ඇතත්, මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. | පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවර ගත යුතු ය. |
| • කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 163 ක් වුව ද, පුරප්පාඩු 86 ක් පැවැති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 53 ක් විය. | සෘජු බඳවාගැනීම් මඟින් සම්පූර්ණ කළ යුතු ආධුනික උපපොලිස් පරීක්ෂක ආධුනික පොලිස් කොස්තාපල් හා ආධුනික පොලිස්, කොස්තාපල් රියදුරු තනතුරු සඳහා බඳවාගැනීම් සිදු කිරීමට අනුමැතිය ඉල්ලා පොලිස්පතිතුමා වෙත ලිපි ඉදිරිපත් කර ඇත. | පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවර ගත යුතු ය. |
| • කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරීන් 03 දෙනෙකු, පොලිස් පරීක්ෂක නිලධාරීන් 80 දෙනෙකු, උප පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) නිලධාරීන් 03 දෙනෙකු, පොලිස් සැරයන් නිලධාරීන් 428 දෙනෙකු හා පොලිස් සැරයන් රියදුරු නිලධාරීන් 32 දෙනෙකු අතිරික්තව සේවයේ යෙදී තිබුණි. | පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් රාජ්‍ය සේවයේ බඳවාගැනීම් සීමා කර ඇති බැවින්, නව බඳවාගැනීම් සිදු කිරීමට මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. පවතින දැඩි නිලධාරි ඌණතාවය හේතුවෙන් පැවරී ඇති රාජකාරී ආවරණය කිරීමට නව බඳවාගැනීම් කඩිනමින් සිදුකර ගත යුතු බව දක්වා තිබුණි. | අතිරික්ත සේවකයන්ට අදාළ අනුමත සීමා සංශෝධනයට කඩිනම් පියවර ගත යුතු ය. |
| **ii. සිවිල් කාර්ය මණ්ඩලය**<br>විශේෂ කාර්ය බලකායට අනුයුක්ත සිවිල් සේවක කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 709 ක් වුව ද, පුරප්පාඩු 182 ක් පැවැති අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 26 ක් විය. | කළමනාකරණ සහකාර (ද්විතීයික මට්ටම) පුරප්පාඩු සම්බන්ධව අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන) වෙත නිරන්තරයෙන් වාර්තා කරන අතර, 2024.01.23 දින අණදෙන නිලධාරීතුමා විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත ද වාර්තාකර ඇති බව දක්වා තිබුණි. | පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවර ගත යුතු ය. |